**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ("අධිකාරිය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 07 වන වගන්තියට පටහැනිව 2021 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු. 2,939,171 ක් වටිනා දේපල පිරියත වලින් රු. 1,888,677ක දේපල වටිනාකම පෙර වර්ෂ අතිරික්තයට ගැලපිය යුතු වූවත් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් නොවන ආදායම් ලෙස ගලපා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් අධිගණනය වී තිබුණි. | ඉදිරියේදී රාජ්‍ය ප්‍රදාන අදාල වර්ෂයේදීම ගිණුම්ගත කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකර ගැනීමට ඉඩදෙන රු. 7,482,162 ක රදවාගැනීමේ බදු මුදල අඩු කර රු. 28,624,788 ක් වගකීම ලෙස දක්වා තිබුණද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ප්‍රකාරව එම ගණනය කිරීමට අදාල විස්තර ගිණුම්කරණ සටහන් මගින් මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණි. | නැවත සංශෝධනය කරන ලද ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාව ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රමිතයෙහි 69 වන ඡේදයට පටහැනිව ප්‍රවර්තන වර්ෂයේ මිලදීගත් රු. 1,299,247ක දේපල පිරියත උපකරණ කාර්යාල සැපයුම් තොග ගිණුමේ ඇතුලත් කර තිබුණි. එම නිසා එම මුදලින් දේපල පිරියත උපකරණ අඩුවෙන් ද, තොගය වැඩියෙන්ද දක්වා තිබුණි. | 2024 වර්ෂය තුල වත්කම් පංතින් ප්‍රත්‍යාගණන කිරීමට අපේක්ෂා කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රමිතියේ 81 වගන්තියට පටහැනිව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ පිරිවැය රු. 729,019ක් වටිනා ස්ථාවර වත්කම් අලෙවියේදී ජනනය වූ ලාභයට අතිරේකව පිරිවැයට සමාන මුදලක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත්කර මෙහෙයුම් නොවන අදායම් ලෙස ගලපා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 729,019ක් වැඩියෙන් දක්වා තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි. | අපහරණය කරන ලද පිරිවැයට සමාන වටිනාකමක් ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත් කර ලාභයට ගලපා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 යේ 74 වගන්තියට පටහැනිව අධිකාරිය විසින් සේවක ප්‍රතිලාභ වෙන් කිරීමේ ගිණුමෙහි වෙනස වූ රු. 9,711,030 ක් සේවක ප්‍රතිලාභ අධිවෙන් කිරීම් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් මෙහෙයුම් වියදම් එම අගයෙන් ඌන ගණනය වී තිබු අතර ශුද්ධ අතිරික්තය අධි ගණනය වී තිබුණි. | 2024 වර්ෂයේදී ගිනුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් නිලධාරීන් වෙත ගෙවිය යුතු යැයි ඇස්තමේන්තු කළ වන්දි ලෙස රු. 3,368,815 ක් සමාලෝචිත වර්ෂයේ සේවක වැටුප් හා | 2024 වර්ෂයේ සිට පාරිතෝෂිත ආයුගණන තක්සේරු වාර්තාවේ සඳහන් ප්‍රවර්තන සේවා පිරිවැය හා පොලී පිරිවැය සඳහා ප්‍රතිපාදන | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වේතන වල ඇතුලත් කර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී එය මුදල් නොවන වෙනස්වීම් යටතේ දක්වා නොතිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 3,368,815 න් අධි ගණනය වී තිබුණි. | වෙන් කරනු ලැබේ. | |
| (ආ) | මෙහෙයුම් නොවන ආදායම් ලෙස රු. 138,977,248 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් නොවන වෙනස්වීම් තුල ගලපා තිබූ අතර ඒතුල ඇතුලත් පාරිතෝෂිත අධි වෙන්කිරීම් සහ ස්ථාවර වත්කම් ක්ෂය නැවත මුදල් නොවන වෙනස්වීම් තුල ගලපා තිබීම හේතුවෙන් රු. 3,955,836 කින් ද්විගණනය වී තිබුණි. එම නිසා මෙහෙයුම් ක්‍රියාකාකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 3,955,836 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙය නිවැරදි කර සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය සතු කතරගම සංචාරක බංගලාව පිහිටි ඉඩම හා එම ගොඩනැගිල්ලේ පිරිවැය පිළිවෙලින් රු. 1,520,000 ක් හා රු. 6,700,000 ක් අධිකාරියේ වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | කතරගම බංගලාවේ හිමිකාරීත්වය අධිකාරිය භාරය ගැනීමට ඉදිරියේදී කටයුතු සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතු රු. 30,481,887 ක් නිදහස් කරගැනීම ආයෝජන ක්‍රියාකරකම් තුළ ගැලපීම හේතුවෙන් ශුද්ධ ආයෝජන ක්‍රියාකරකම් එම අගයෙන් වැඩිපුර දක්වා තිබුණි. | මෙය නිවැරදි කර සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද ස්ථාවර තැන්පතු 04 හි වටිනාකම උපලේඛනය අනුව රු. 506,686,029 ක් ලෙස දැක්වෙන අතර අවසන් ගිණුම් තුල රු. 508,254,487ක් ලෙස දක්වා තිබීම නිසා රු. 1,568,458 ක වෙනසක් නිරීක්ෂණය විය. | මේ වැරැද්ද 2024 වර්ෂයේ JE-43 මගින් පසුගිය වර්ෂයට අදාලව නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 10(ආ) වගන්තිය පරිදි අධිකාරියේ අතිරික්තය ගණනයේදී අඩු කළ රු. 1,391,557ක් වූ සංග්‍රහ වියදම් ද රු. 265,095ක් වූ අස්පෘශ්‍ය වත්කම් | නැවත සංශෝධනය කරන ලද ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාව ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රමක්ෂය ද රු. 38,400ක් වූ දඩ හා අයහාර සහ රු. 9,711,030 වටිනා සේවක ප්‍රතිලාභ ද සේවයෙන් ඉවත් කළ නිලධාරින්ට ගෙවීමට ඇස්තමේන්තු කළ රු.3,368,815 ක වන්දි මුදලද බදු ආදායම ගණනයේදී නැවත ලාභයට එකතු කර ගණනය කර නොතිබුණි. තවද ප්‍රාග්ධන දීමනා රු. 3,383,191 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. ඒ හේතුවෙන් බදුවන ආදායම රු. 11,391,706 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඊට අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු. 3,417,512 ක් අඩුවෙන් ගණනය වී තිබුණි. | | |
| (උ) | ආදායම් බදු වගකීම ගණනය කිරීම අනුව ආදායම් බදු වෙන් කිරීම රු.48,016,852 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ එය රු. 44,106,950 ක් ලෙස දක්වා තිබීමෙන් ආදායම් බදු වෙන් කිරීම රු.3,909,902 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නැවත සංශෝධනය කරන ලද ආදායම් බදු ගණනය කිරීමේ වාර්තාව ඉදිරිපත් කර ඇත. | ආදායම් බදු නිවැරදිව ගණනය කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියෙහි 2023 දෙසැම්බර් 31 දිනට එකතුවක් ලෙස රු. 13,132,807 වන ණයගැති ශේෂයක් පැවතුණි. ඉන් රු. 9,473,681ක් වර්ෂ 05 ඉක්මවූ ණයගැති ශේෂ විය. | මීගමුව රෝහලෙන් ලැබිය යුතු හිගමුදල ලබාගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගෙන් සාකච්ඡාවක් ඉල්ලා ඇත. ගම්පහ රෝහලෙන් අදාල හිගමුදල් ගෙවන බවට එකඟ වී ඇත. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවිධ ණයහිමියන් ලෙස රු. 22,503,432ක ශේෂයක් පැවති අතර එහි වර්ෂ 05 ඉක්මවූ රු. 12,430,649 ක් ශේෂයක් නිරවුල් නොකර පැවතුනි. | ණයහිමි ශේෂ තුල නිවාස සංකීර්ණ සතු මුදල් ඇති අතර කළමනාකරණ සංස්ථා පිහිටුවීමෙන් පසු එම කළමනාකරණ සංස්ථා අරමුදල වෙත එම මුදල් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 | වැඩබැලීමේ පත් කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස පමණක් වුවද, අධිකාරියේ පාලන කටයුතු මෙන්ම තීරණ ගැනීමට සම්බන්ධ වන නිලධාරීන් වන සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන), සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්/ නඩත්තු) යන තනතුරු 03 ක් සඳහා වසර 2 කට වැඩි කාලයක් වැඩබැලීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. | මෙම ආයතනයේ පුරප්පාඩු පිළිබඳව 2024 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් ලද අනුමැතිය අනුව අදාල බඳවා ගැනීම් සිදුකෙරේ. | ආයතන සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ මාර්ගෝපදේශවල 6.2 (ඇ) ඡේදය | රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු. 506,686,028 ක ස්ථාවර තැන්පතු 05 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු වල ආයෝජනයට අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශ ලේකම් මගින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත 2023 මාර්තු 16 ලිපියක් යොමු කර ඇත. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත 3 පරිච්ඡේදයේ 6.2 ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව උපාය මාර්ගික සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා එපරිද්දෙන් කටයුතු කෙරේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 නොවැම්බර් 21 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 ජාතික අයවැය චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශ හෝ ආයතන මට්ටමින් සිදුකරනු ලබන විවිධ දීමනා ගෙවීම් අත්හිටුවීම හා විවිධ සුභසාධන සහනාධාර හා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නව බැඳීම් ඇතිකර නොගත යුතුය. එසේ වුවද අධිකාරිය විසින් සමස්ථ කාර්යමණ්ඩලයට රු. 5,000 බැගින් ඵලදායිතා දීමනාවක් | අධිකාරියේ ඉලක්කගත ලාභය ලඟාකර ගැනීමට අනුමත සේවක සංඛ්‍යාව 130 කගේ රාජකාරී 94 දෙනෙකුගෙන් ආවරණය කරගත යුතු වූ බැවින් පැමිණීම දිරිමත් කිරීමට මාසිකව නිවාඩු 2 ක් හෝ ඊට අඩුවෙන් ලබාගන්නා සේවකයන්ට මාසිකව රු. 5000 ක ඵලදායිතා | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ගෙන සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු. 3,495,000ක් ගෙවා තිබුණි. | දීමනාවක් වර්ෂයකට සීමාවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ලබා දී ඇත. | |
| (ඉ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල(සංශෝධන) පනතේ 05 වන ඡේදයේ (ඌ) වගන්තිය | සහාධිපත්‍ය දේපල වල ප්‍රවේශ මාර්ග, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන හා එළිමහන් ස්ථාන නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල එම නඩත්තු කිරීම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි. | පැවරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 154,512,945 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 131,059,472 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,453,473 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් නොවන ආදායම රු. 34,222,392 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

(අ) අධිකාරියෙහි 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මුළු වියදම රු. 2,007,356 කින් වැඩි වී තිබුණි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදමේ රු. 1,307,230ක වැඩි වීම හේතුවී තිබුණි. මෙහිදී සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය යටතේ වූ සංග්‍රහ වියදම රු. 863,954කින් වැඩිවීම ද මෝටර් රථ සඳහා ඉන්ධන වියදම රු. 3,019,216 කින් වැඩිවීම ද නඩත්තු වියදම් තුල ඇතුලත් රු. 5,152,682 ක වාහන අළුත්වැඩියා සහ නඩත්තු වියදම වැඩිවීම ද ඊට බලපා තිබුණි. තවද අධිකාරියේ සේවකයන් 13 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුල විශ්‍රාම යාම හේතුවෙන් ඉකුත් වසරට සාපේක්ෂව වැටුප් හා වේතන රු. 7,775,009කින් අඩු වී තිබුණි.

(ආ) ආයතනයේ 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 11,561,935කින් පහල ගොස් ඇති අතර මෙහෙයුම් නොවන ආදායම රු. 34,222,392කින් වැඩි වී තිබුණි. මෙහෙයුම් ආදායම පහල යාම කෙරෙහි මූලික වශයෙන් ඒකක 05ට වැඩි අර්ධඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද සහතික වල ආදායම රු. 36,513,214කින් අඩුවීම සහ ඉදිකර අවසන් දේපල සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම රු. 973,124 අඩු වීමද ගම්පහ රෝහල් පොම්පාගාර නඩත්තු ආදායම් ලැබීම රු. 1,994,191කින් අඩු වීමද බලපා තිබුණි.

(ඇ) මෙහෙයුම් නොවන ආදායම රු. 34,222,392 කින් ඉහල යාමට ස්ථාවර තැන්පතු සඳහා වන පොලිය රු. 32,972,461කින් ඉහල යාම මූලික වශයෙන් හේතුවී ඇත. එමෙන්ම මෙම මෙහෙයුම් නොවන ආදායම තුල එකතුව රු. 4,684,855ක මුදලින් ජනනය නොවූ පාරිතෝෂිත අධි වෙන්කිරීමක්, අපහරණය කරන ලද භාණ්ඩ වල ප්‍රත්‍යාගන අගය හා ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය කිරීමක්ද ගලපා තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජංගම අනුපාතය 1.2:1 ක් සහ ක්ෂණික අනුපාතය 1.2:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ දී ද පිළිවෙලින් 2.1: 1 සහ 2.07:1 විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 – 2018 කාලය තුල මූලික නිශ්කාශන ලිපි ලබාගෙන තිබූ දේපල 400ක් සඳහා අවසන් සහතිකය ලබාගෙන නොතිබූ අතර එම දේපල වල වලංගු කාලය නැවත අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද තාවකාලික සහාධිපත්‍ය සහතික ලබාගෙන තිබූ දේපල 50ක් ද අර්ධ සහාධිපත්‍ය සහතික ලබාගත් 15ක් ද අවසන් සහතික ලබාගෙන නොතිබුණි. දේපල 65න් දේපල 20ක්ම පලාත් පාලන ආයතන වලින් අනුකූල හා සහතික ලබා නොගැනීම ඊට හේතු වී තිබුණි. | මූලික නිශ්කාෂණ ලිපි නිකුත් කර අවුරුදු 03 ඉක්මවූ ව්‍යාපෘති සඳහා අවසාන සහතික නිකුත් කිරීමට පෙර මූලික නිශ්කාෂණ ලිපිය අළුත්කර අවසාන සහතික නිකුත් කිරීමට 2023 වර්ෂයේ සිට කටයුතු කෙරේ. | නියමිත කාල තුළ සහතික පත්‍ර නිකුත් කිරීමට හැකිවෙන පරිදි නිසි ක්‍රම වේදයක් සකස් කර ගත යුතුය. |
| (ආ) | අධිකාරිය වෙත ලැබී තිබූ පැමිණිලි 1387කින් 67ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම පැමිණිලි අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පැමිණිලි 25 ක් වූ අතර, ජල කාන්දු වීම් සම්බන්ධ පැමිණිලි 13 ක් විය. ඉන් 06 ක් ලැබී වසර 2 - 5 ත් අතර කාලයක් ගත වී තිබීම හේතුවෙන් දේපල හා ජීවිතවලට අනතුරුදායක තත්වයක පැවතුණි. | පැමිණිලි ලැබීමෙන් පසු පාරිභෝගික අංශයෙන් විසඳීමට හැකි තාක් උත්සහ කරන අතර එසේ කළ නොහැකි ඒවා නීති අංශයට යොමු කර පරීක්ෂණ සාධාරණ කාලයක් තුල අවසන් කිරීමට කටයුතු සිදු කෙරේ. | කඩිනමින් ගැටළු විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1982 අංක 45 දරණ බද්ධ නිවාස (සංශෝධිත) පනතේ වූ ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන එකතු කිරීම් යටතේ එහි 3(2) වගන්තිය ප්‍රකාරව හා 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධිත) පනතේ 27(3) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සංස්ථාවල මහ සභා රැස්වීම් පැවැත්විය යුතු අතර එහි 8(4) (අ) අනුව කළමනාකරණ සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම්වල පිටපත් අධිකාරියට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් අධිකාරියේ පවතින කළමනාකරණ සංස්ථා 1014න් 586ක් ලියාපදිංචි කරන ලද දින සිටම වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර නොමැති අතර ඉතිරි සංස්ථා 428න් 403ක ප්‍රවර්තන වසරේ විගණිත වාර්ෂික ගිණුම් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර මාස 3ක් ඇතුලත කළමනාකරණ සංස්ථා | කළමනාකරණ සංස්ථා වල වාර්ෂික ගිණුම් වාර්තා විගණනය කිරීම සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවන බැවින් විගණනයක් සිදු නොකර බව කළමනාකරණ සංස්ථා විසින් ප්‍රකාශ කර ඇත. | සංස්ථාවල වල වාර්ෂික ගිණුම් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිහිටවිය යුතු වුවත් 2022 – 2023 කාලය තුල ලියාපදිංචි කළ දේපල 39ක් සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථා පිහිටුවා නොතිබුණි. | | |
| (ඇ) | සහාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීම අධිකාරියේ ප්‍රධානතම කාර්යයක් වුවත්, එසේ නිකුත් කරනු ලබන සහතිකපත්වලට අදාළ ලිපිගොනු ආරක්ෂා සහිතව නිසි පරිදි ගබඩා කර තැබිය යුතු වුවත් එම ලිපි ගොනු අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණි. | ලිපිගොනු ගබඩා කිරීමට ඉඩපහසුකම් අවම ප්‍රමාණයක පවතින අතර ලේඛනාගාරය නැවත සකස් කරමින් පවති. | කඩිනමින් එම ලිපි ගොනු ආරක්ෂිතව ගබඩා කල යුතුය. |
| (ඉ) | 1973 අංක 11 දරණ බද්ධනිවාස අයිතිවාසිකම් පනතේ 5(2) වගන්තිය අනුව අනුකූලතා සහතික ලබා නොගත් දේපල වල තැනැත්තෙකු පදිංචි නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර තිබූ සහාධිපත්‍ය දේපල 21 සඳහා අවසන් සහතික ලබාගෙන නොතිබූ අතර පවුල් 12,734 ක් එම මහල් නිවාස වල පදිංචි කර තිබුණි. සහාධිපත්‍ය සහතිකය ලබා නොගැනීම හේතුවෙන් මෙම නිවාස සංකීර්ණවල කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී ඇති අතර නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවීම සහ නිවාස හිමියන්ට ඔප්පු ලබා දීමට නොහැකි වී තිබුණි. තවද මෙම සහාධිපත්‍ය දේපල වල පැවතිය යුතු පොදු පහසුකම් පවතිද සහ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත ප්‍රකාරව දේපල හිමි අය විසින් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව අධිකාරිය සිය වගකීම් පැහැර හැර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | පනතේ විධිවිධාන අනුව කඩිනමින් කටයුතු කළයුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අධිකාරියේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 139 හා 94 ක් ද පුරප්පාඩු 45 ක් ද වූ අතර එ තුළ මාණ්ඩලික තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි. ඉහත මාණ්ඩලික තනතුරු 07 ක් 2010 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පියවීමට කටයුතු කරමින් පවති. | අත්‍යාවශ්‍යම වන තනතුරු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |

## 3.3 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතුව පවතින අංක KU-1433 දරණ වාහනය 2019 දෙසැම්බර් 14 දින අනතුරකට භාජනය වී තිබුණි. එහි ඇස්තමේන්තුගත අළුත්වැඩියා වියදම රු. 2,559,571ක් වූ අතර අනතුරෙන් වසර 04ක් ගත වී ඇතත් 2024 මාර්තු 25 වන විටත් මෙහි අළුත්වැඩියාව සිදුකර නොතිබුණි. තවද එම අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හදුනාගෙන අලාභය අයකරගැනීමට අවශ්‍ය කටයුතුද සිදුකර නොතිබුණි. | මු.රෙ 104 පරීක්ෂණයක් නැවත කිරීමට අමාත්‍යාංශයේ ලේකම් තුමා කමිටුවක් පත් කර ඇත. | වාහන පද්ධතිය නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 - සෑම ඉන්ධන පරික්ෂාවකටම මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරික්ෂාවක් කළයුතු වුවත් අධිකාරීය සතු වාහන 12ක් සඳහා 2019 වසරෙන් පසු ඉන්ධන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | 2024 මැයි සිට සියළු වාහනවල ඉන්ධන පරික්ෂාවට කටයුතු සිදු කෙරේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් නොවන ආදායමෙහි අයවැයගත ආදායම රු. 180,960,000ක් වු අතර සත්‍ය ආදායම රු. 138,927,248 ක් විය. මෙම සත්‍ය ආදායම තුල මුල්‍ය නොවන ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය වන රු. 1,888,677ක් ද පාරිතෝෂිත අධිවෙන්කිරීම් රු. 2,067,159ක්ද අපහරණ භාණ්ඩ වල ප්‍රත්‍යාගණන අගයවන රු. 729,019ක් ද ඇතුලත් කර තිබුණි. ඒ අනුව මුදලින් ලැබිය හැකි සත්‍ය මෙහෙයුම් නොවන ආදායම රු. 134,242,393ක් විය. එය අයවැයගත ආදායමට වඩා සියයට 26 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | අයවැය ලේඛනය පාලන උපකරණයක් ලෙස යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරියෙහි අයවැයගත මෙහෙයුම් ආදායමට වඩා සත්‍ය ආදායම රු. 74,974,714 කින් එනම් සියයට 29 කින් අඩු වී තිබු අතර සමස්ථ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 26 කින් අඩු වී තිබුණි. | අදහස් දක්වා නැත. | අයවැය ලේඛනය පාලන උපකරණයක් ලෙස යොදා ගත යුතුය. |